**මහියංගණය ප්‍රාදේශීය සභාව**

**බදුල්ල දිස්ත්‍රික්කය**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2020 කාශන ප්‍රවර්ෂයේ මූල්‍ය 2019 පෙබරවාරි 24 වන දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020ජූලි 06 දිනද, විස්තරාත්මක කලමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 23 වන දිනද, සභාපතිවරයාට යවා ඇත.

### .1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට මහියංගණය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.13,473,753 ක් වූ ගොඩනැඟිලි 03 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | 2020 මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නිවැරදි කර ඇත. |

**(ආ) <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| රු.8,263,052 ක ඉඩම් හා ගොඩනැඟිලි ශේෂය සත්‍යාපනය සඳහා ඔප්පු, පිඹුරුපත්, පැවරුම් නියෝග හා විධිමත් තක්සේරු වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉඩම් වල නීත්‍යානුකූල අයිතිය පවරා දෙන ලෙස ඉඩම් කොමසාරිස් ජනරාල්/ ප්‍රාදේශිය ලේකම් හා නිවාස සංවර්ධන අධිකාරිය වෙත ඉල්ලීම් කර ඇතත් පවරාදීමට කටයුතු කර නොමැත. |

**1.4** <u>**අනුකූල නොවීම**</u>

<u>**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**</u>

| | නීති,රීතිරෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | --------------------- | ------------------------- | ----------- | -------------------- |
| (අ) | <u>1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත</u> | | | |
| | 122,126(අ) වගන්තිය හා 1988 23 අගෝස්තු 7/520 දිනැති අංක දරන ගැසට් නිවේදනයේ සම්මත අතුරු 39 වස්ථාවේවා වන ඡේදය | දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කරන ස්ථාන හඳුනාගෙන ගාස්තු අයකළ යුතු වුවද, 2019 වර්ෂය වෙනුවෙන් හඳුනාගත් ස්ථාන 71 කින් රු.264,400 ක ගාස්තුවක් අය කරගෙන නොතිබුණි . | සභාවට අයවිය යුතු ගාස්තු අය කරගත යුතුවේ. | සභාවට ගාස්තු අයවීමට තිබෙන දැන්වීම් පුවරුවලින් ගාස්තු අයවි ඇත. |
| (ආ) | <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි</u> | | | |
| | මුදල් රෙගුලාසි 104 | පසුගිය වර්ෂය තුල සිදුවූ වාහන අනතුරු 05 ක් සම්බන්ධයෙන් අවශ්‍ය පරීක්ෂණ සිදුකර වාර්තා කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුවේ. | අලුත්වැඩියාව සඳහා මිළගණන් ලබාගෙන සාධාරණීකරණ වාර්තාව ලබාගැනිමට ප්‍රමාද විය. |

**2.** <u>**මූල්‍ය සමාලෝචනය**</u>

**2.1** <u>**මූල්‍ය ප්‍රතිඵල**</u>

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,576,509 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.11,935,268 ක් විය.

2.2 <u>**ආදායම් පරිපාලනය**</u>

**2.2.1** <u>**ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31දිනට හිඟ ආදායම | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i | වරිපනම් හා බදු | 4,000,000 | 3,001,655 | 2,172,110 | 829,545 | 3,031,235 | 3,031,235 | 2,343,601 | 687,634 |
| ii | කුලී | 2,365,200 | 2,479,200 | 1,997,080 | 482,120 | 2,221,200 | 2,221,200 | 1,853,800 | 377,400 |
| iii | ජල ගාස්තු | 4,000,000 | 4,920,200 | 3,871,534 | 1,048,666 | 4,200,000 | 4,857,452 | 3,771,596 | 1,085,858 |
| | එකතුව | 10,365,200 | 10,401,055 | 8,040,724 | 2,360,331 | 9,452,435 | 10,109,887 | 7,968,997 | 2,150,892 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසර 03 කට අධික කාලයක සිට පැවත එන ලැබිය යුතු ආදායම් රු.21,302,139 ක් අය කරගෙන නොතිබුණි. | ලැබිය යුතු ආදායම් අය කර ගැනීමට කටයුතු කල යුතුවේ. | හිඟ මුදලින් රු.256,000 කට ආසන්න මුදලක් ලැබී ඇත. ඉතිරිය අය කර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති හිඟ උසාවි දඩ රු.2,428,933 ක් සහ හිඟ මුද්දර ගාස්තු රු.2,500,000 ක් අය කරගෙන නොතිබුණි. | හිඟ උසාවි දඩ සහ හිඟ මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | උසාවි දඩ හා මුද්දර ගාස්තු උපලේඛන සකස් කර යවා ඇත. හිඟ මුද්දර ගාස්තු වලින් මේවනවිට රු.1,217,253 ක් ලැබී ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණද,සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් කාරණා 10 ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා හෝ වැළඳගෙන හෝ නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුවේ. | අතුරු ව්‍යවස්ථා සකස් කර පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. |

(ආ) <u>ක්‍රියාකාරී සැලැස්ම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | ඉදිරියේදි ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කරමි. |

(ඇ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව එක්සත් ජාතින්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව දැනුවත්වී තිබුණද, සභාවට අදාල කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක සම්බන්ධව නිලධාරින්ට පුහුණුවක් අවශ්‍ය වේ. |

**3.2** <u>වත්කම්වල අපේක්ෂිත භාවිතයෙන් බැහැරවීම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016 වර්ෂයේදි රු.3,586,027 ක වියදමක් දරා වැඩ නිම කර තිබුණු සතිපොළ ගොඩනැගිල්ල කසල වෙන්කර තබාගැනීම සඳහා භාවිතා කරමින් පැවතුනි. | ඉදිකිරිමේදි අපේක්ෂිත අරමුණ සඳහා යොදවාගත යුතුවේ. | එම ගොඩනැගිල්ලේ ඉඩකඩ සතිපොල පවත්වාගෙන යාමට ප්‍රමාණවත් නොවන බැවින් කසල එකතුකර වෙන්කර ගබඩා කර තබා ගැනිමට භාවිතා කරමි. |

**3.3** <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පොදු වෙළඳපොල භූමියේ සහ වෙළඳ සංකීර්ණයේ පිහිටි කඩ කාමර 51කින් රු.4,098,290 ක කුලී අය කරගෙන නොතිබුණි . | හිඟ කුලි අයකරගත යුතුවේ. | බදු ගිවිසුම් සඳහා විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලද පසු මෙම හිඟ මුදල් අය කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ බැකෝ යන්ත්‍ර හා ගලි බවුසර් ආදායම් රු.247,806 ක් අය කරගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකරගත යුතුවේ. | ආයතන දෙකකින් මේවන විට මුදල් ලැබී ඇති බව හා ඉතිරි අයතන දෙකෙන් හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වසර 03 කට අධික කාලයක සිට පැවත එන රු.11,330,039 ක ණයහිමි ශේෂය නිරවුල් කර නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | සියයට 86 ක ප්‍රමාණයක් දැනටමත් නිරවුල් කර ඇත. ඉතිරිය නිරවුල් කිරීමට කටයුතු කරමි. |

**3.4 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා සීමාව තුල පවතින සුසානභූමි 52 ක් පවරාගෙන නොතිබුණි. | පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුවේ. | පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කරමි. |

**3.5 <u>මානව සම්පත් කළමනාකරණය</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් දිනට 31 අනුමත කාර්යය මණ්ඩලයේ තනතුරු 08 කට අදාලව පුරප්පාඩු 14 ක්පැවතුනි. | අත්‍යාවශ්‍ය කාර්ය මණ්ඩල පුරප්පාඩු පුරවා ගත යුතුවේ. | තනතුරු හා පුරප්පාඩු පිළිබඳව පළාත් පාලන කොමසාරිස්වරයා දැනුවත් කිරීමට කටයුතු කර ඇත. |

**3.6 <u>අභ්‍යන්තර විගණනය</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතුවේ. | අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවෙන් අභ්‍යන්තර විගණනය සිදු නොකිරීම සම්බන්ධයෙන් කරුණු කිසිවක් ප්‍රකාශ කළ නොහැකිවේ. |

**4. <u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>**

**4.1 <u>විගණන හා කළමනාකරණ කමිටු</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුල කළමනාකරණ කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි. | කාර්තුවකට එක් වරක් වන පරිදි විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුවේ. | ඉදිරියේදි නිසි පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වමි. |